මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.02.15 |

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 ජනවාරි

## 2021 ජනවාරි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනය විය.

**2021 ජනවාරි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය 60.2ක් වාර්තා කරමින් වර්ධනය වූ අතර,** නව ඇණවුම් සහ නිෂ්පාදන වල සිදුවූ වර්ධනය මේ සඳහා හේතු විය. තොග මිලදී ගැනුම් උප දර්ශකයේ ඉහළ යාමද සමස්ත දර්ශකයේ වර්ධනය කෙරෙහි දායක විය.

උත්සව සමයෙන් පසු විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක යහපත් මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, පවතින COVID-19 තත්ත්වය හේතුවෙන් ඉල්ලුම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම ව්‍යාපාරික කටයුතුවලට බලපා ඇති බව මෙම අංශයේ සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

නව බඳවා ගැනීම් සමඟ මෙම කාලය තුළ සේවා නියුක්තිය ඉහළ වේගයකින් වර්ධනය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් වසංගතය ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු හේතුවෙන් සේවකයින් සේවයේ යොදවා ගැනීම සීමා කිරීමට සිදුවීම නිසා නියමිත වේලාවට නිෂ්පාදන නිම කිරීම අභියෝගාත්මක වූ බව සමහර නිෂ්පාදකයින් අවධාරණය කරන ලදී.

| විචලයය | 2020 දෙසැ. | 2021 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **61.2** | **60.2** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 63.5 | 60.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 60.1 | 57.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.1 | 51.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 55.6 | 59.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 75.3 | 76.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වේගයකින් වර්ධනය වුව ද, පැවති තොග ක්ෂය වීම සහ එළඹෙන චීන නව අවුරුදු නිවාඩුව සමග සැපයුම් කෙරෙහි ඇතිවිය හැකි බාධා සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය තොග ඇණවුම් කිරීම හේතුවෙන් තොග මිලදී ගැනුම් ඉහළ වේගයකින් වර්ධනය විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යන ලදී. වරාය / නැව්ගත කිරීම සම්බන්ධ ගැටළු හේතුවෙන් ඔවුන්ගේ නැව් භාණ්ඩ ලැබීම ප්‍රමාද වූ බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

රට තුළ මෙන්ම ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය තවදුරටත් ඉහළ යන ලදී.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.0ක පහළ යෑමකි |
|---|---|
| **60.2** | |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3 කින් පහළ යමින් 2021 ජනවාරි මාසයේදී 53.5ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 ජනවාරි මාසයේදී එක්සත් ජනපදය, ඉන්දියාව සහ රුසියාව හි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය සහ චීනයේ එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 පෙබරවාරි 15 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**ධනාත්මක ලෙස වසර ආරම්භ කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජනවාරි මාසයේ දී 56.2ක් ලෙස වාර්තා විය.** COVID-19 වසංගතයෙහි දෙවන රැල්ල හේතුවෙන් පසුබෑමකට ලක් වූ සේවා අංශය තවදුරටත් යථා තත්ත්වයට පත්වීමක් මෙමගින් පෙන්නුම් කෙරේ. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු ඉහළ යෑම් මෙම වර්ධනය සඳහා දායක විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, ප්‍රවාහන, සහ තොග සහ සිල්ලර වෙළඳාම උපඅංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමග සේවා අංශයේ නව ව්‍යාපාර 2021 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2021 ජනවාරි මාසයේ දී අඛණ්ඩව දෙවන මාසයටත් ඉහළ ගියේය. ජනතාව නව සාමාන්‍යකරණයට අනුගතවීමත් සමග 2021 ජනවාරි මාසයේ දී භාණ්ඩ සහ මගී ප්‍රවාහන උපඅංශයෙහි වර්ධනයක් වාර්තා විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී ලබා දුන් ප්‍රවර්ධන වට්ටම් හේතුවෙන් දේශීය සංචාරකයන්ගේ පැමිණීම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග නවාතැන් සහ ආහාරපාන සැපයීමේ උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය විය. මීට අමතරව, 2021 ජනවාරි මාසයේ දී මූල්‍ය සේවා, අධ්‍යාපන සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. එහෙත්, ආනයන වෙළඳාමෙහි යෙදී සිටින ප්‍රතිචාර දක්වන්නන් අත්‍යවශ්‍ය නොවන ආනයන මත පනවා ඇති සීමා හේතුවෙන් මුහුණපා ඇති ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව අඛණ්ඩව සඳහන් කරන ලදී.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන්ගේ සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම සහ විශ්‍රාම ගැනීම් සිදු වුවද නව බඳවාගැනීම් ප්‍රමාද වීම හේතුවෙන්, 2021 ජනවාරි මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය.

COVID-19 වසංගතය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු මගින් ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට සිදු වූ අවහිරතා හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් 2021 ජනවාරි මාසයේ දී ඉහළ යන ලදී.

| විචල්‍යය | 2020 දෙසැ. | 2021 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **55.6** | **56.2** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 55.0 | 55.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 64.5 | 60.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.4 | 43.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 51.6 | 53.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.5 | 67.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ජනතාව නව සාමාන්‍යකරණයට අනුගතවීමත් සමග COVID-19 වසංගතයෙහි දෙවන රැල්ලෙහි බලපෑමට ලක් වූ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳව සේවා සපයන්නන්ගේ සුභවාදී අදහස් ඉහළ යෑම හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2021 ජනවාරි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**56.2**

**2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑම මන්දගාමී වීමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 දෙසැම්බර් මාසයේ පැවති 51.8 සිට 2021 ජනවාරි මාසයේ දී 51.6 දක්වා පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 ජනවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 පෙබරවාරි 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.